# ජාතික ගමනාගමන කොමිෂන් සභාව
# (ජාගකොස)

## <u>ප්‍රධාන කාර්යාලීය ආපනශාලාව සඳහා</u>
## <u>ටෙන්ඩර්පත් කැඳවීම - 2019</u>

# ජාතික ගමනාගමන කොමිෂන් සභාව (ජාගකොස)
# ප්‍රධාන කාර්යාලීය ආපනශාලාව සඳහා ටෙන්ඩර්පත් කැඳවීම 2019

01. කොළඹ 05, උද්‍යාන පාරේ, අංක 241 දරණ ස්ථානයේ පිහිටි ජාතික ගමනාගමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ 250ක පමණ සේවක සංඛ්‍යාවක් සහ රාජකාරි කටයුතු වලට බැහැරින් පැමිණෙන පුද්ගලයින් වෙනුවෙන් ස්ථාපිත කිරීමට අපේක්ෂිත ආපනශාලාව පවත්වාගෙන යාමට පළපුරුදු හෝටල් ආපනශාලා භාරකරුවන්ගෙන් ලංසු භාර ගනු ලැබේ. ලංසු පත්‍රිකා 2019-03-11 දින සිට 2019-03-18 දින 1200 පැය දක්වා කාර්යාල වේලාවන් තුළදී භාරදිය හැක. එය ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක සුභ සාධක සංගමයේ ලේකම්තුමිය වෙත භාරදිය හැක.

02. ලංසු පත්‍රිකාවේ සියළුම පිටු වල ලංසුකරු විසින් කෙටි අත්සන යොදා තම මුද්‍රාව තැබිය යුතුය.

03. 2019-03-18 වන දින 1200 පැයට හෝ එයට පෙර පහත සඳහන් ලිපිනයේ ඇති මෙම කාර්යය සඳහා නඩත්තු කරනු ලබන ලංසු පෙට්ටියට ලංසු පත්‍රිකා බහාලීමට හෝ පහත අත්සන්කරුට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදිය හැකිය. ලංසු ඉදිරිපත් කිරීමේදී කවරයේ ඉහළ වම් කෙළවරේ “ජාගකොස ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර්පත් කැඳවීම - 2019 සේවක සුභසාධක සංගමය ” යනුවෙන් සඳහන් කළ යුතුය.


ලේකම්,<br>
සේවක සුභසාධක සංගමය,<br>
ජාතික ගමනාගමන කොමිෂන් සභාව,<br>
අංක 241, උද්‍යාන පාර,<br>
කොළඹ 05.

**ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ ආපනශාලාව පවත්වාගෙන යාමට අදාල උපදෙස් හා කොන්දේසි.**

01) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලීය ආපනශාලාව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අවුරුද්දක් හෝ ඊට කෙටි කාලයක් හෝ ආසන්න කාලයක් තුළ, තාවකාලිකව එකී ආපනශාලාව පවත්වාගෙන යාමට අවසරය ඉල්ලා එවනු ලබන ලංසු පත්‍රයයි. ................................................................................................................................ලිපිනයේ පදිංචි, ......................................................................................වන මම කොළඹ 05, උද්‍යාන පාර, අංක 241 හි පිහිටි ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ආපනශාලාවට, .........................................වෙනිදායින් ආරම්භකර ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අවුරුද්දක් හෝ ඊට කෙටි හෝ ආසන්න කාලයක් තුළ, ජාගකොස (ප්‍ර/කා) ආපනශාලාවට ආහාරපාන හා කැවිලි පෙවිලි සැපයීමේ අවසරය ඉල්ලා ලංසු පත්‍ර එවන ලෙස, මෙහි පහත සේවා පක්ෂ යනුවෙන් ව්‍යවහාරවන ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සේවක සුභසාධක සංගමය මෙයින් ආරාධනා කරයි.

02) ලංසු පෝරම නියමිත පරිදි පුරවා තනි කවරයක දමා සීල් තබා ලිපි කවරය වම් කෙළවරේ **“ ජාගකොස (ප්‍ර/කා) ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ලංසු කැඳවීම 2019 ”** යන්න සඳහන් කර 2019 මාර්තු මස 07 වෙනි දින හෝ ඊට පෙර ලැබෙනසේ සුභසාධක සංගමයේ ලේකම් නමට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනවිත් භාරදිය යුතුය.

03) මෙම යථෝක්ත ආපනශාලාව පරීක්ෂාකර, එකී සේවා ගිවිසුම් සහ කොන්දේසි සම්පූර්ණ වශයෙන් දැන ඔබට සේවාව භාරදුනහොත්, ඔබගේ වියදමින් සියලු කම්කරුවන්, උපකරණ, වියලි ආහාරපාන ද්‍රව්‍ය යන දේ සපයාගෙන කොමිෂන් සභාවේ කොන්දේසිවලට අනුකූලව මේ සේවාව කිරීමට ඔබට භාරදෙනු ලැබේ.

04) ඔබගේ ලංසු පත්‍රය පිළිගත් බව දන්වා එවන නිවේදනය ලැබී සතියක් ඇතුළතදී වර්ෂයක් සඳහා නියමිත රු. 15,000/= ක ඇප තැන්පත් මුදලක් තැබීමට සූදානම්ව සිටිය යුතුය.

05) පොරොන්දු ඉටු නොකළ රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට පෞද්ගලික වශයෙන් හෝ සාමුහික වශයෙන් ඔබගේ නම ඇතුළත්වී නොවී තිබිය යුතුය.

06) ශීතකරණයක් ආපනශාලාවේ සවිකිරීමටත් එය නිතරම ක්‍රියාත්මක වන තත්වයෙන් තබා ගැනීමටත්, සූදානම්ව සිටිය යුතුය.

07) ආපනශාලාව පාවිච්චි කිරීම වෙනුවෙන් දිනපතා කුලිය වශයෙන් රු. 1000/=ක් වශයෙන් මාසිකව ජාගකොස සේවක සුභසාධක සංගමය වෙත ගෙවිය යුතුය. ඔබට ගෙවිය හැකි මුදල දක්වන්න.

08) ලංසුපත්‍රයේ යම් වෙනසක් හෝ යම් මැකීමක් කලහොත්, ලංසුකරු විසින් එහි තමාගේ කෙටි අත්සන තැබිය යුතුය. සැපයීමට තමා සූදානම් නොමැති දෑ ලංසුකරු විසින් ඉවත්කර දැමිය යුතුය.

09) ටෙන්ඩරය සඳහා අයදුම්කරන ටෙන්ඩර්කරු විසින් ගිවිසුම අත්සන් කරන කාලය තුළදී ආපන ශාලාව පවත්වාගෙන යා යුතුවේ. ඔහු විසින් තවත් අයෙකු හට පවත්වාගෙන යාමේ බලය පවරා නොදිය යුතු අතර, එසේ ලබාදුනහොත් ඇප තැන්පතුව අවලංගු කරනු ලැබේ.

10) තෝරාගනු ලැබූ ලංසුකරු මුල් වතාවේදී ජාගකොස විසින් තීරණය කරනු ලබන අවුරුද්දක් හෝ ඊට කෙටි කාලයක් හෝ ආසන්න කාලයක් සේවයේ රඳවාගනු ලැබේ. කෙසේ වෙතත්, සේවා පක්ෂය හා මේ කොන්ත්‍රාත්තුවේ හවුල්කරු විසින් සම්මත කරගන්නා කොන්දේසි පිට තවත් එවැනි කාලයකට දීර්ඝ කිරීමේ බලය ඇත.

11) මීට අමුණා තිබෙන ආහාර දර්ශණයෙහි සඳහන් වන සියලුදේ දිනපතා සැපයීමට ලංසුකරු සූදානම්ව සිටිය යුතුය. සැපයීමට අවසර ඇති වෙනත් ආහාරපාන වර්ග මිලගණන් ලංසුකරුගේ අභිමතය පරිදි අනුමැතිය සඳහා ඉදිරිපත් කළ හැකිය.

12) සේවා පක්ෂයේ හුදු අභිමතය මත මිස මින් දන්වා ඇති මිල දර්ශණයේ සඳහන්වූ අනුමත කරනලද මිල ගණන් වැඩි කිරීමට ඉඩදෙනු නොලැබේ.

13) අනුමත කරන ලද ආහාරපාන මිල දර්ශණයෙහි පිටපතක් ලංසුකරු විසින් ආපනශාලාවේ ප්‍රදර්ශණය කළ යුතුය.

14) ආපනශාලාවේ නිකුත් කරනු ලබන ආහාරපානවල තත්ත්වයන්, ප්‍රමාණයන් සේවා පක්ෂයේ අදහස අනුව සතුටුදායක විය යුතුය. 1949 අංක 25 දරණ ආහාර හා ඖෂධ පනතේ විධිවිධාන, භෝජනාගාර, බත් කඩ හා සෙසු යම් කාර්යය සම්බන්ධයෙන් ඇති රෙගුලාසි, නගරසභා රෙගුලාසි, නාගරික සභා රෙගුලාසි යන මේවා ලංසුකරු විසින් පිළිපැදිය යුතුය. මත්ද්‍රව්‍ය, මත්පැන් හෝ සුරාබඳු පනත යටතේ එවැනි අන් කිසිවක් විකිණීමට හෝ පරිභෝජනය කිරීමට නොහැකි අතර ඒ සඳහා කුමන වේලාවකදීවත් අවසර දෙනු නොලැබේ.

15) ආහාරපාන සම්පාදක තැන විසින් ඔහුගේ වියදමෙන් නගර සභාවෙන් ආහාර සැපයීම සඳහා පත්කළ බලපත්‍රයක් ලබාගත යුතුය.

16) ආපනශාලාවට විදුලිබලය සහ ජලය සැපයීම, ජාගකොස විසින් කරනු ලැබේ. පහසුකම අරපරිස්සමින් ප්‍රයෝජනයට ගැනීමට, තෝරාගනු ලැබූ ලංසුකරු වගබලාගත යුතුවේ.

17) ආපනශාලාවේදී පාවිච්චි කරන සියලු විදුලි බලය සහ ජල සැපයුම සඳහා වූ ගාස්තුව ඇතුලුව ආපනශාලාව පාවිච්චි කිරීමේදී කුලිය වශයෙන් දෛනිකව රු.1000/= ක මුදලක් ලංසුකරු විසින් ගෙවිය යුතුය. මෙහි බදුකුලිය සෑම මසකම 10 වෙනිදා හෝ ඊට කලින් අනිවාර්යයෙන්ම ගෙවා එහි පිටපතක් ටෙන්ඩර් මණ්ඩලය වෙත ලබාදිය යුතුය.

**ගෙවිය හැකි මුදල..................................**

18) මීට අමුණා තිබෙන " ඇ" වෙනි උප ග්‍රන්ථයේ සඳහන්වූ ගෘහභාණ්ඩ හා උපකරණ සැපයීම ජාගකොස විසින් කරනු ලැබේ.

19) තෝරාගනු ලැබූ ලංසුකරු විසින් තමා අතින්, තම නියෝජිතයා අතින් හො තම සේවක පිරිස අතින් ගොඩනැගිලිවලට, ගෘහභාණ්ඩවලට හා උපකරණවලට යම්කිසි හානියක් සිදුවුවහොත් අදාල අලාභය ජාගකොස වෙත ගෙවිය යුතුය.

20) ජාගකොස විසින් සපයා ඇති සියලුම ගෘහභාණ්ඩ හා උපකරණ ඉතා පරිස්සමින් පාවිච්චි කිරීමටද, ආපනශාලා භූමිභාගයත්, එහි පාවිච්චි කරන ලද සියලු ගෘහභාණ්ඩත් ශුද්ධ පවිත්‍රව ප්‍රියමනාප අන්දමින් තබාගැනීමට තෝරාගනු ලැබූ ලංසුකරු විසින් කළ යුතුවේ.

21) කුණුරොඩු හා අපිරිසිදු ජලය ආපනශාලාවෙන් දිනපතා ඉවත් කිරීමට තෝරාගනු ලැබූ ලංසුකරු විසින් වගබලාගත යුතුය.

22) තමාට දෙනලද භාණ්ඩවල නිවැරදි වට්ටෝරුවක් තෝරාගනු ලැබූ ලංසුකරු විසින් ලියාතබා ගත යුතුය. යම් භාණ්ඩයකට හානියක් සිදුවුවහොත් ඒ භාණ්ඩය වෙනුවට ඒ වර්ගයේම වෙනත් භාණ්ඩයක් ඔහු විසින් තමාගේ මුදලින් ගෙනවිත් තැබිය යුතුයි. පාවිච්චි කිරීම නිසාවූ සාමාන්‍ය ගෙවීයාම අතහැර දමනු ලැබේ.

23) ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සපයන ලද භාණ්ඩවලට අතිරේක වශයෙන් මුලුතැන්ගෙයි පාවිච්චියට උවමනා වන සියලු හැලි වලං, හැඳි, ගෑරුප්පු, පිහි, වීදුරු බඳු, පිඟන්, පීරිසි කෝප්ප, මේස රෙදි යන මේවා තෝරාගනු ලැබූ ලංසුකරු විසින් සපයාගත යුතුය.

24) හොඳින් හා කාර්යක්ෂම අන්දමින් ආපනශාලාව පවත්වාගෙන යාමට අවශ්‍ය වන සේවක පිරිස සෞඛ්‍ය අතින් යහපත් වූද, ආචාරශීලී වූද, තැනැත්තන් විය යුතුය. ඔවුන් පිරිසිදුවටත් නිසි අන්දමටත් ඇඳුම් ඇඳසිටිය යුතුය.

25) තම සේවක පිරිස් අතින් කෙරෙන විනය කඩ කිරීමක් හෝ ආචාරශීලී නොවීමක් වශයෙන් වටහාගත හැකි සියලු ක්‍රියා සම්බන්ධයෙන් වගකීමට තෝරාගනු ලැබූ ලංසුකරු බැඳී සිටිනවා පමණක් නොව මේ ගැන තබනලද පැමිණිලි පිළිබඳව සේවා පක්ෂය දෙනලද තීරණ, අවසාන තීරණය ලෙස සලකා ඊට අවනත විය යුතුය.

26) දිනපතා කාර්යාල වේලාවන් තුළ ආපනශාලාව විවෘතකර තිබිය යුතුය. තමන්ගේ අභිමතය පරිදි මේ වේලාවන් වෙනස් කිරීමේ බලය සේවා පක්ෂය වෙතම තබාගනු ලැබේ. **සේවා පක්ෂයෙන් පෙර දැනුම් දීමකදී සාමාන්‍ය වේලාවෙන් පසුවද ආහාර සැපයීමට තෝරාගනු ලැබූ ලංසුකරු සූදානම්ව සිටිය යුතුයි.**

27) සේවා පක්ෂයේ විධිමත් අනුමැතියක් නොමැතිව තෝරාගනු ලැබූ ලංසුකරු විසින් මේ කොන්ත්‍රාත්තුව යටතේ තමාට පැවරෙන බලය හා අයිතිවාසිකම් ආදිය වෙන කෙනෙකුට බදුදීම හෝ කුලියට දීම හෝ පැවරීම හෝ නොකළ යුතුයි.

28) මේ ගිවිසුම සඳහා වූ ගෙවිය යුතු මුද්දර ගාස්තු තෝරාගනු ලැබූ ලංසුකරු විසින් ගෙවිය යුතුයි. සේවාව නිසි පරිදි කරන බවට ජාතික ගමනාගමන කොමිෂන් සභාව සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳීමටත්, ටෙන්ඩරය පිළිගත් බවට දන්වා දින 07ක් ඇතුළත රු.15,000/=ක ඇපයක් තැබීමටත් කටයුතු කළයුතුය. ලංසුව පිළිගත් බවට දන්වන දැන්වීම ලංසුකරු දී ඇති ලිපිනයට තැපැල් කළහොත්, නැත්නම් ඒ ලිපිනයට භාරදුනහොත් ඒ දැන්වීම ලංසුකරුට ලැබුණු බවට සලකනු ලැබේ.

29) යම් ලංසුකරුවෙකු නියමිත කාලය ඇතුළත කොන්ත්‍රාත්තුවට අත්සන් නොකළහොත්, නැත්නම් අත්සන් කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ ඇප මුදල් ජාතික ගමනාගමන කොමිෂන් සභාව සන්තක වීමටත්, ඔහු තම යුතුකම පැහැර හැරිය ලංසුකරුවන්ගේ නාමලේඛන ලැයිස්තුවට ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ.

30) ආපන ශාලාව තුළ ලොග් පොතක් තබාගත යුතුය. සේවා පක්ෂයට හෝ ප්‍රධාන කාර්යාලයේ සේවකයන්ට එහි පැමිණිලි ලිවීමට හෝ විවේචනයන් ලිවීමට හෝ ලංසුකරු විසින් සෑම අවස්ථාවකදීම පහසුකම් සැලසිය යුතුය.

31) තෝරාගනු ලබන ලංසුකරු කොන්ත්‍රාත්තුවේ ඇති යම් කොන්දේසියක් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් නැත්නම් පිළිපැදීම පැහැර හැරියහොත්, එසේ කොන්දේසි කඩන අවස්ථාවේදී රු.500/=කට නොවැඩි දඩයක් ලිත් මාසයක් තුලදීද, රු.5000/= කට නොවැඩි වන්නාවූ දඩයක් අවුරුද්දක් තුලදීද ඔහුට නියම කිරීමට සේවා පක්ෂයට නීත්‍යානුකූල බලය ඇත. කොන්ත්‍රාත්තුව බරපතළ අන්දමින් හෝ නිතර නිතර කඩකලහොත් ලංසුකරුට ලිත් මාසයක් කල්දී කොන්ත්‍රාත්තුව අවලංගු කරන අතර එසේ අවලංගුකල විට ඇප තැන්පත් මුදල සේවා පක්ෂය සන්තක වේ. සේවා පක්ෂයට තමාට වේයැයි තක්සේරු කරන යම් අලාභයක් වෙතොත් එයද ලංසුකරු විසින් සම්පූර්ණ වශයෙන් ගෙවිය යුතුය.

32) ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමේ බලය ජාතික ගමනාගමන කොමිෂන් සභා සේවක සුභසාධක සංගමය සතු වේ.

33) කොන්ත්‍රාත් ලිපියේ ඇති ඕනෑම වගන්තියක අර්ථය සම්බන්ධයෙන් සේවා පක්ෂයේ තීරණය අවසාන ලෙස ක්‍රියාත්මක විය යුතුය.

34) මෙහි පහත වෙන්කර තිබෙන කොටසෙහි ලංසුකරුගේ අත්සන තබා මෙම පෝරමය සමඟ ආපසු එවිය යුතුයි.

35) ඉහත සඳහන් ලංසු කොන්දේසි කියවා බැලුවෙමි. ඒ කොන්දේසි අනුව කටයුතු කිරීමට මම එකඟ වෙමි.

36) ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමේ බලය ජාතික ගමනාගමන කොමිෂන් සභා සේවක සුභසාධක සංගමය සතු වේ.

37) කොන්ත්‍රාත් ලිපියේ ඇති ඕනෑම වගන්තියක අර්ථය සම්බන්ධයෙන් සේවා පක්ෂයේ තීරණය අවසාන ලෙස ක්‍රියාත්මක විය යුතුය.

38) මෙහි පහත වෙන්කර තිබෙන කොටසෙහි ලංසුකරුගේ අත්සන තබා මෙම පෝරමය සමඟ ආපසු එවිය යුතුයි.

39) ඉහත සඳහන් ලංසු කොන්දේසි කියවා බැලුවෙමි. ඒ කොන්දේසි අනුව කටයුතු කිරීමට මම එකඟ වෙමි.

**විශේෂයෙන් සැලකිය යුතුය**

40) ආහාර ඉවීම සඳහා ආයතනය ඇතුළත පහසුකම් නොමැත. ආහාර පිටින් පිස රැගෙන ආ යුතුය.

41) අපද්‍රව්‍ය දිනපතා බැහැර කළ යුතුය.

මෙහි දක්වා ඇති සියලු තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් ප්‍රකාශ කරමි.

............................................ ......................................................

දිනය ලංසුකරුගේ අත්සන